සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# පෙරදිග සංගීතය - I

**12 ශ්‍රේණිය**

**කාලය පැය 02 යි.**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

---

(01) කාෆි ඨාටයෙන් උපදින රාගයකි,
(1) දේශ් (2) බිහාග් (3) භාගෙස්‍රී (4) ජෞනපූරි (5) තිලක්කාමෝද් (......)

(02) ''ඔබයි රම්‍ය සඳ කිරණ ගන අන්ධකාරේ'' මෙම ගීතය ගැයෙන තාලය අනුව යොදා ගත හැකි හින්දුස්ථානි තාලය නම්,
(1) දීප්චන්දි (2) කවජ (3) කෙහෙර්වා (4) බෙම්ටෝ (5) ලාවණී (......)

(03) සප්තකයේ පංචමය දක්වා අතරෙහි වාදි ස්වරය පිහිටන රාග,
(1) සන්ධි ප්‍රකාශ රාගයි. (2) සමප්‍රකෘති රාගයි. (3) පූර්වාංගවාදී රාගයි.
(4) උත්තරාංගවාදී රාගයි. (5) ඡායාලග රාගයි. (......)

(04) රි, ප ස්වර දෙක වාදි සංවාදි වන රාග යුගලය වන්නේ,
(1) දේසේ භෛරව (2) භාගෙස්‍රී භීමපලාශ්‍රී (3) ජෞනපුරි බිහාග්
(4) තිලක්කාමෝද් දේශ් (5) භෛරව කාලිංගඩ (......)

(05) වර්ජ ස්වර ඇසුරු කරමින් හෝ විවාදි අනියමිත ස්වර ආශ්‍රය කරමින් ගී කීම,
(1) අව්‍යවස්ථික දෝෂයයි. (2) අනුනාසික දෝෂයයි. (3) අනවධාන දෝෂයයි.
(4) අපස්වර දෝෂයයි. (5) අව්‍යක්ත දෝෂයයි. (......)

(06) එක් ස්වරයක සිට හඬ නොකඩවා ගමන් කිරීම හඳුන්වන්නේ,
(1) මීන්ඩ් (2) ගමක් (3) ආන්දෝලන (4) කන් (5) මේ කිසිවක් නොවේ (......)

(07) රි, ප වාදි සංවාදි වන රාගයේ ජාතිය ෂාඩව සම්පූර්ණ වේ. මීට අදාළ රාගය වන්නේ,
(1) බිහාග් (2) දේශ් (3) භාගෙස්‍රී
(4) ආශාවරී (5) තිලක්කාමෝද් (......)


(08) දොං ජිංත ගත දොංත මෙම බෙරපදයට අදාළ තිත් රූපය වන්නේ,
(1) මැදුම් මහ දෙතිත (2) සුළු මැදුම් දෙතිත (3) මැදුම් තනිතිත
(4) මහ තනිතිත (5) සුළු මහ දෙතිත (......)

(09) පෙරදිග සංගීතයේ කෝමල, තීව්‍ර යන පද වෙනුවට අපරදිග සංගීතයේ භාවිතාවන සමාන පද වන්නේ,
(1) ෆ්ලැට් ෂාප් ය. (2) මයිනර් මේජර්ය. (3) නැචුරල් ෂාප් ය.
(4) ලෝනෝට් හයිනෝට් ය. (5) ටෝන් සෙමිටෝන් ය. (......)

(10) ශාස්ත්‍රීය ගායනයක් ඉදිරිපත් කිරීමේදී යොදා ගැනීම සඳහා සුදුසුම භාණ්ඩ යුගලයක් වන්නේ,
(1) බටනලාව හා වලීනය යි. (2) තාම්පුරාව හා තබ්ලාව යි. (3) තබ්ලාව හා බටනලාව යි.
(4) තාම්පුරාව හා තබ්ලාව යි. (5) සර්පිනාව හා තබ්ලාව යි. (........)

(11) එක්තරා සංගීත පද්ධතියක ස්වර සාධනය ''නෙම්, බැරං, ගුලු, දදා, නිමා, පෙලොග්' ආදී වශයෙන් ස්වර නම් කරයි. එම සංගීත පද්ධතිය කුමක් ද?
(1) බටහිර සංගීත පද්ධතිය. (2) භාරතීය සංගීත පද්ධතිය. (3) චීන සංගීත පද්ධතිය.
(4) ඉස්ලාමික් සංගීත පද්ධතිය. (5) ගැමිලෑන් සංගීත පද්ධතිය. (........)

(12)



ඉහත බටහිර තාල සංකල්පය අනුව ඊට ටයිම් සිග්නේචර් යොදා නැත. ඊට ටයිම් සිග්නේචරය යෙදූ කළ එම තාලය නම් කරන්නේ කෙසේ ද?

(1) Three Four Time වන අතර එය Simple Duple Time වර්ගයට අයත් වේ.
(2) Three Four Time වන අතර එය Simple Triple Time වර්ගයට අයත් වේ.
(3) Six Eight Time වන අතර එය Compound Duple Time වර්ගයට අයත් වේ.
(4) Six Eight Time වන අතර එය Compound Triple Time වර්ගයට අයත් වේ.
(5) Three Four Time වන අතර එය Simple Quadruple Triple Time වර්ගයට අයත් වේ. (........)

(13) ඔක්ස්පර්ඩ් ශබ්ද කෝෂයේ ''සංගීතය'' යන්න නිර්වචනය කර ඇත්තේ කෙසේ ද?
(1) ගායනය, වාදනය සහ නැටීම යන කරුණු තුනේ එකතුව සංගීතයයි.
(2) සමූහ ගායනය සංගීතයයි.
(3) හැඟීම් ප්‍රකාශනය සඳහා නාද සංයෝජනය කිරීමේ කලාව සංගීතයයි.
(4) සමූහ වාදනය සංගීතයයි.
(5) රසවත්වූ තනු නිර්මාණය සංගීතයයි. (........)

(14) |රි ස |නි ධ නි |ස |ම ග ග |යනුවෙන් ආරම්භ වන සර්ගම් ගී පාදය අයත්වන රාගය,
(1) බිහාග් රාගය (2) භාගෙස්‍රී (3) දේස් රාගය (4) ජයජයවන්ති (5) තිලක්කාමෝද් (......)

(15) මුඛඩා, තිහායි, ඛඩලා, පරන්, චක්‍රධාර්යන වාද්‍ය අංගයන්ගෙන් නොගැලපෙන අංගය කුමක් ද?
(1) පරන් (2) මුඛඩා (3) චක්‍රධාර් (4) ඛඩලා (5) තිහායි (........)

(16) |නිස ගම පනි සරි |සනි ධප මග රිස |මෙම තානාලංකාරය අයත් වන්නේ,
(1) බාගෙස්‍රී (2) බිහාග් (3) තිලක්කාමෝද් (4) ජයජයවන්ති (5) දේශ් (........)

(17) x|0|2|0|3|4 මෙම තාල සංඥා යෙදෙන හින්දුස්ථානි තාලය,
(1) තීලවඩා (2) ත්‍රිතාල් (3) දීප්චන්දි (4) කෙහෙර්වා (5) චෞතාල් (........)

(18) ''සදාරංග මෝගල් යුගය'' සිහිපත් කෙරෙන සංගීතමය කරුණක් වන්නේ,
(1) ගසල් ය. (2) ඛ්‍යාල් ය. (3) කව්වාලි ය. (4) ධ්‍රැපද් ය. (5) ධමාර් ය. (........)

(19) සාමාන්‍ය ජනතාව අතරේ පවතින සංගීත ක්‍රමයකි,
(1) දේශීය සංගීතය (2) මාර්ග සංගීතය (3) කර්ණාට සංගීතය
(4) හින්දුස්ථානි සංගීතය (5) භාරතීය සංගීතය (........)

(20) රාගධාරී වාදන ශෛලියේ උච්චතම අවස්ථාවයි,
(1) ගමක් (2) ජලා (3) අන්තරා (4) මුඛඩා (5) තානාලංකාර (........)

- **අංක 21 - 30 දක්වා වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

(21) ගීතයේ වචන යොදාගෙන ගයනු ලබන තන වර්ගය කුමක් ද?

..........................................................................................................................

(22) එංගලන්තය, ග්‍රීසිය, ඔස්ට්‍රියාව, ජර්මනිය ආදී රටවල පවතින සංගීතය කුමක් ද?

..........................................................................................................................

(23) භාරතීය සංගීතයට අනුව දේශීය සංගීතය බෙදෙන කොටස් 02 කුමක් ද?

..........................................................................................................................

(24) කර්ණාටක සංගීතයට අයත් තාලයක් නම් කරන්න.

.......................................................................................................................................

(25) මෝගල් යුගයේ යුග පුරුෂයා ලෙස හඳුන්වන්නේ කවුරුන් ද?

.......................................................................................................................................

(26) දෙතිතේ ප්‍රභේද කොපමණ ද?

.......................................................................................................................................

(27) භාගෙස්ශ්‍රී රාගයට අදාළව ස්වර සංගතියක් ලියා දක්වන්න.

.......................................................................................................................................

(28) රාත්‍රී දෙවන ප්‍රහරයේ ගැයීමට සුදුසු රාගයක් නම් කරන්න.

.......................................................................................................................................

(29) ඉතා කුඩා ප්‍රමාණයක් සියුම්ව සුසර කිරීමට වයලීනයේ ඇති කොටස කුමක් ද?

.......................................................................................................................................

(30) ධ්‍රැපද් ගීත සඳහා යොදා ගන්නා තාලය ලියන්න.

.......................................................................................................................................

(31) කර්ණාට සංගීත පද්ධතියට අයත් ''මෝහනම්'' රාගය හින්දුස්ථානි සංගීත පද්ධතියේ කිසියම් රාගයක් හා සමාන වේ. එම රාගය,

(1) දේශ් (2) බහාර් (3) කාෆි (4) බිහාග් (5) භූපාලි (........)

(32) අපරදිග සංගීතයට ආවේනික වූ මූලික ලක්ෂණයකි,

(1) හාමනි (2) ගමක් (3) තිහායි (4) උපජ් (5) මූර්ති (........)

(33) ජයජයවන්ති රාගය,

(1) සමප්‍රකෘති රාගයකි. (2) පරමේල ප්‍රවේශක රාගයකි. (3) සන්ධි ප්‍රකාශ රාගයකි.
(4) කර්ණාටක රාගයකි. (5) මිශ්‍ර රාගයකි. (........)

(34) තීව්‍ර මධ්‍යමය ප මʼ ප යනුවෙන් විවාදි ස්වරයක් ලෙස යෙදෙන රාගය,

(1) බිහාග් (2) දේශ් (3) භාගෙස්ශ්‍රී (4) ඛමාජ් (5) යමන් (........)

(35) |සරි සරි සරි ග |රිග රිග රිග ම | යන තානාලංකාරය,

(1) ශුද්ධ තානයකි. (2) ගමක් තානයකි. (3) සරල තානයකි.
(4) අලංකාරික තානයකි. (5) මිශ්‍ර තානයකි. (........)

(36) දිල්රුබ, සන්තූර්, වීණාව, ස්වර මණ්ඩලය, සරෝද් මෙම සංගීත භාණ්ඩ අතරින් නොගැලපෙන සංගීත භාණ්ඩය තෝරන්න.

(1) සරෝද් (2) සන්තූර් (3) වීණාව (4) දිල්රුබ (5) ස්වර මණ්ඩලය (.....)

(37) උට්, රේ, මී, ෆා, සෝල්, ලා යනුවෙන් ස්වර 6 කින් යුතු ස්වර මාලිකය සකස්කරන ලද බටහිර සංගීතඥයා නම්,

(1) ශාන්ත ඇම්බ්‍රෝස් බිෂොප් (2) ගීඩෝද ඇරෙස්සෝ (3) ගියොම් ද මැෂෝ
(4) ජොස්කැන් ඩේෂ්‍රේ (5) කර්වින් (........)

(38) මැටි ශෛල, ලෝහ, හම්, ලී වැනි ද්‍රව්‍යයන් මූලික වශයෙන් යොදා ගෙන නිර්මාණය කරගත් සංගීත භාණ්ඩ දක්නට ලැබෙනුයේ,

(1) භාරතීය සංගීතයේ (2) බටහිර සංගීතයේ (3) කර්ණාටක සංගීතයේ

(4) ගැම්ලෑන් සංගීතයේ (5) චීන සංගීතයේ (........)

(39) මාත්‍රා 14 කින් යුත් හින්දුස්ථානි තාලය වන්නේ,

(1) තිලවඩා (2) ත්‍රිතාල් (3) දීප්චන්දි (4) බෙම්ටෝ (5) ජප්තාල් (........)

(40) කර්ණාට සංගීතයේ එන මේල 72 පිළිබඳ කරුණු සඳහන්ව ඇති වගන්තිය,

(1) ස්වර මේල කලානිධි (2) සංගීත රත්නාකරය (3) නාට්‍ය ශාස්ත්‍රය

(4) චතුර් දණ්ඩි ප්‍රකාශිකා (5) සංගීත සාර (........)

- **අංක 41 - 50 දක්වා වූ ප්‍රශ්න වලට හිස්තැන් පුරවන්න.**

(41) බිහාග් රාගයේ වාදි ................................................ වන අතර ........................................................ සංවාදි වේ.

(42) සන්ධි ප්‍රකාශ රාගයන්හි .................................... ස්වරය හා .................................... ස්වරය කෝමලව යෙදේ.

(43) වැඩි වශයෙන් බොටා ඛ්‍යාල් ගීත සඳහා .................................... තාලය ද, .................................... බඩා, ඛ්‍යාල් ගීත සඳහා ද යොදා ගනී.

(44) භාරතීය සංගීතය .................................... හා .................................... සංගීතය යනුවෙන් ප්‍රධාන කොටස් 02 කි.

(45) හින්දුස්ථානි පද්ධතියේ ................................................ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වන අතර ................................................ කර්ණාටක පද්ධතියේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩයක් වේ.

(46) ගැම්ලෑන් සංගීතයේ ප්‍රභවය ................................................ හා ................................................ දූපත් වල සිදුවිය.

(47) ගීතයක් හෝ වාදිතයක් අවසන් කිරීමේදී එකම කොටසක් තුන් සැරයක් වාදනය හෝ ගායනය කිරීම ............................................ නම් වන අතර, වාදනය සඳහා යොදා ගන්නා රාගධාරී ස්වර ලිපි ................................................ නමින් හැඳින්වේ.

(48) රාගධාරී මධ්‍යලය ගීතයක වචන යොදාගනිමින් ආලාප සිදුකිරීම ............................ ලෙස ද, වාදනයට පමණක් සුවිශේෂී ආලාප ................................................ ද නම් වේ.

(49) දේශීය තිත් ක්‍රමයේ ප්‍රධාන ආඝාත වශයෙන් .................................... හා .................................... සංකේත භාවිතා වන අතර හින්දුස්ථානි තාල පද්ධතියේ ප්‍රබල තාල සංඥාව ලෙස .................................... ත්, දු .................................... සංඥාව ලෙසත් නම් කෙරේ.

(50) පෙරදිග සංගීතයේ ........................................................ නාද ක්‍රමය මුල් වන අතර, අපරදිග සංගීතයේ ........................................................ නාද ක්‍රමය මුල් වේ.

(2 x 50 = 100)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# පෙරදිග සංගීතය - II

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- **I** කොටසින් ප්‍රශ්න දෙකකටද, **II** කොටසින් එක් ප්‍රශ්නයකටද, **III** කොටසින් ප්‍රශ්න දෙකකට ද වනසේ ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න..

---

## I කොටස

01\. (i) පහත සර්ගම් පාද වලට අදාළව රාග නම් කරන්න. (ල.04)

(a) නි̣ ධ̣ නි̣ ස | රි ග නි̣ ස | රි ග රි ප | ම ග නි̣ ස

(b) රි ස | <u>නි</u> ධ̣ <u>නි̣</u> | ස | ම <u>ග</u> <u>ග</u>

(c) ග ස | ග ම | ප නි ප | ග ම

(d) <u>නි</u> ධ ප ම | ග රි ග ස | රි රි ම ප | නි නි ස̇

(ii) (c) කොටසට අයත් මධ්‍යලය ගීතයේ ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල.06)

(iii) (a) කොටසට අයත් රාගය අදාළව තානාලංකාර 02 ක් නිර්මාණය කරන්න. (ල.04)

(iv) (b) කොටසට අදාළ සර්ගම් ගීතය ලියා දක්වන්න. (ල.06)

02\. (i) නිෂාධය දෙයාකාරයෙන් යෙදෙන රාගයක් නම් කරන්න. (ල.02)

(ii) එම රාගයට අදාළව ස්වර 30 කට නො අඩු ආලාප ඛණ්ඩය නිර්මාණය කරන්න. (ල.06)

(iii) ඉහත රාගයේ රාග විස්තරය ලියා දක්වන්න. (ල.06)

(iv) ම, ස වාදි සංවාදි වන ඔබ නිර්දේශිත රාගයේ ස්වර අභ්‍යාසයක් ආරෝහණ, අවරෝහණ වශයෙන් ගොඩ නඟන්න. (ල.06)

03\. (i) මාත්‍රා 6, 8, 10, 12, 14, 16 යෙදෙන හින්දුස්ථානි තාල නම් කරන්න. (ල.04)

(ii) මාත්‍රා 10, 14 යන තාල වල ඨේකාව සම දෙගුණ සිව්ගුණ වශයෙන් ප්‍රස්තාර කරන්න. (ල.08)

(iii) දෙතිතේ ප්‍රභේද නම් කර ඒවා ප්‍රස්තාර කර දක්වන්න. (ල.08)

## II කොටස

04\. (i) ආලාප යනු කෙටියෙන් හඳුන්වන්න. (ල.04)

(ii) ආලාප වර්ග නම් කර ඒවා හඳුන්වන්න. (ල.08)

(iii) ආලාප ගායනයෙන් හා වාදනයෙන් ආධුනිකයෙකුට ලැබෙන පිටිවහල සැකෙවින් පහදන්න. (ල.08)

05. (i) ලෝකයේ පවතින මහා සංගීත සම්ප්‍රදායන් වූල සංගීත සම්ප්‍රදායකින් වෙන්කොට හඳුනාගත හැකි අයුරු පැහැදිලි කරන්න. (ල.08)

(ii) මහා සංගීත සම්ප්‍රධායන් වශයෙන් පිළිගැනෙන සංගීත පද්ධති නම් කරන්න. (ල.05)

(iii) බටහිර දාර්ශනිකයන් හා අධ්‍යාපනඥයින් සංගීතය පිළිබඳ විවිධ අදහස් දක්වා ඇත. ඉන් දෙදෙනෙකුගේ නිර්වචනයන් 02 ක් ඉදිරිපත් කරන්න. (ල.07)

## III කොටස

06. (i) තබ්ලාවේ රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න. (ල.08)

(ii) තබ්ලාවේ බායාවෙන් උපදිනා අක්ෂර හා දායාං කොටසින් උපදිනා අක්ෂර වෙන වෙනම ලියා දක්වන්න. (ල.04)

(iii) තබ්ලාවේ කොටස් දෙකේ එකතුවෙන් උපදිනා අක්ෂර ලියා දක්වන්න. (ල.04)

(iv) ප්‍රවීණ ශ්‍රී ලාංකික තබ්ලා වාදකයින් දෙදෙනෙක් හා භාරතීය තබ්ලා වාදකයින් දෙදෙනක් නම් කරන්න. (ල.04)

07. (i) පහත සඳහන් බටහිර ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ල.08)



(ii) ඉහත ප්‍රස්තාරයට සුදුසු ටයිම් සිග්නේචරය ලියා දක්වන්න. (ල.04)

(iii) ඔබ පෙරදිග ක්‍රමයට පෙරලූ ප්‍රස්තාරය මධ්‍යම භාවයට ලියා දක්වන්න. (ල.08)

08. (i) බටහිර ස්වර ප්‍රස්තාරකරණයේ ආරම්භය සිදුවූ ආකාරය දක්වන්න. එය වර්ධනය වූ අයුරු දක්වන්න. (ල.08)

(ii) බටහිර සංගීතය දේවස්ථානයෙන් බැහැරවී පොදු ජන වින්දනය සඳහා සංගීත රටා බිහිවීම ඇරඹුනේ කුමන වකවානුවේ ද? එහි පුරෝගාමියා කවුද? (ල.04)

(iii) චීන සංගීතයේ විකාශනය යුග වශයෙන් දක්වන්න. (ල.08)

The National e-learning Portal for The General Education